# පරිසරය

## 4 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education



# 15 මිනිසා සහ තොරතුරු

අදහස් තොරතුරු හා ආකල්ප එක් පුද්ගලයෙක් ගෙන් තවත් පුද්ගලයෙක්ට යැවීම සන්නිවේදනය ලෙස හැඳින්විය හැක. එය වාචික හෝ අවාචික තොරතුරු අදහස් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමකි.

මිනිසා තනිව ජීවත්වීමට අකමැති අතර සමූහයක් ලෙස ජීවත්වීම ප්‍රිය කරයි. සමූහයක් ලෙස ජීවත්වීමේ දී සමූහයේ සාමාජිකයන් අතර මෙන්ම එක් එක් සමූහය අතර ද සන්නිවේදනය කිරීමේ ක්‍රම අවශ්‍ය විය.

අතීතයේ දී සන්නිවේදනය සඳහා මෙවැනි ක්‍රම භාවිත විය.

1. අංග චලන / කතාබහ / කටින් කට
2. අණබෙර වැයීම
3. ගිනිගොඩක් ගැසීම
4. හූ කීම
5. කොඩි එසවීම
6. සතුන් මඟින් ( අශ්වාරෝහක පරෙවියන් , හංසයින් යොදා ගැනීම)

## ක්‍රියාකාරකම 1

- මෙම විනෝදජනක ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
  1. ඉවත දමන තරමක් ලොකු ටින් එකක් සොයා ගන්න.
  2. ලණුවක් දමා ඉනේ බැඳ ගැනීමට හැකි ලෙස සකසා ගන්න.
  3. ටින් බෙරයට තට්ටු කිරීමට කෝටුවක් සකසා ගන්න.
- අණ බෙරයක් ලෙස යැවිය හැකි යහපත් සෞඛ්‍ය පුරුදු ඇතුළත් පණිවිඩයක් සකස් කරන්න.
- එය කියමින් අණ බෙරය ගසන්න.


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 2



- ඔබේ මුහුණෙන් මෙවැනි හැඟීම් ප්‍රකාශ කළ හැකි බව ඔබ දන්නවා ද ?
  - * සතුට
  - * බය
  - * ශාන්ත ගතිය
  - * පිළිකුල
  - * ශෝකය
  - * තරහව
  - * වීරත්වය
- ඔබටත් ඔබේ මුහුණෙන් මෙවැනි හැඟීම් ප්‍රකාශ කළ හැකි දැයි මුහුණ බලන කන්නාඩිය ඉදිරියට ගොස් , කර බලන්න.
- දෙමාපිය වැඩිහිටි උදව් ඇතිව ඉහත දක්වා ඇති ආකාරයේ හැඟීම් ප්‍රකාශ කළ හැකි වෙස් මුහුණු නිර්මාණය කරන්න.
- ඉහත දක්වා ඇති හැඟීම්වලට උදාහරණ ලෙස එක් අවස්ථාව බැගින් ලියන්න.

උදා : 1. සතුට - සෙල්ලම් බඩුවක් තෑග්ගක් ලෙස ලැබුණ විට
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................
6. ..........................................................................................................
7. ..........................................................................................................
8. ..........................................................................................................

- **මිනිසුන් අකුරු ලිවීමට හුරුවීමත් සමග ම පසු කාලයේ දී ලිඛිත සන්නිවේදනයට යොමු විය.**
- ඒ අනුව ලිඛිත සන්නිවේදනයේ අංග තුනකි .
  - i. යවන්නා
  - ii. මාධ්‍යය
  - iii. ලබන්නා

| යවන්නා | මාධ්‍යය | ලබන්නා |
|---|---|---|
| ලියුම ලියන්නා / යවන්නා | ලියුම | ලියුම ලබන්නා |


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 3

- මෙම විනෝදජනක ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

1. දෙමාපිය වැඩිහිටියෙකුගේ උදව් ඇතිව ලියුම් දැමීමට පෙට්ටියක් සකස් කරන්න.
2. A4 කඩදාසියක් සපයාගෙන ලියුම් කවරයක් සකස් කරන්න. එහි දකුණු පස ලබන්නාගේ ලිපිනය ද වම්පස යවන්නාගේ ලිපිනය ද ලියන්න.
3. අතීතයේ ලියුම්කරුගේ ඇඳුම, ඔහු පැළඳි දේවල් , ලියුම් බෙදීමට ගෙයින් ගෙට ගිය ආකාරය දෙමාපිය වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.

නූතනයේ දී පරිගණකය භාවිත කරමින් විද්‍යුත් තැපැල මගින් ඉතා පහසුවෙන් සන්නිවේදන කටයුතු සිදු කිරීමට හැකියාව ලැබී තිබේ.

මෙමගින්,

- ලිපි සැකසීම
- ලිපි යැවීම
- පින්තූර යැවීම
- තැටි වීඩියෝ දර්ශන මගින් තොරතුරු සන්නිවේදනය කිරීම.
- කටහඬ තැපැල් (voice mail ) භාවිතය

## ක්‍රියාකාරකම 4

- ඔබේ නිවසේ පරිගණක යන්ත්‍රයක් තිබේ නම් වැඩිහිටියෙකුගේ උදවු ඇතිව ඉහත සඳහන් ඒවා පිළිබඳව අසා දැන ගන්න.





Copyright© www.e-thaksalawa.moe.gov.lk



වර්තමානයේ දී අපට තොරතුරු දැන ගැනීම සඳහා විවිධ ක්‍රම භාවිත කිරීමේ පහසුකම් තිබේ.

- පුවත්පත්
- ගුවන් විදුලිය
- රූපවාහිනිය
- දුරකථනය
- පරිගණකය /අන්තර්ජාලය
- පුස්තකාල භාවිතය

## ක්‍රියාකාරකම 5

- ඉහත එක් එක් ක්‍රම මගින් සිදු කර ගත හැකි සන්නිවේදන කාර්යයන් ලියන්න

උදා - පුවත්පත් - ප්‍රවෘත්ති දැන ගැනීමට

I. ....................................................................................................
II. ....................................................................................................
III. ....................................................................................................
IV. ....................................................................................................
V. ....................................................................................................
VI. ....................................................................................................



- තොරතුරු ලබා ගන්නා විවිධ ක්‍රම පහත වගුවෙහි ඇතුළත් කරන්න.

| ඇස් | කන් | ඇස් / කන් |
|---|---|---|
| පුවත්පත | ගුවන් විදුලිය | රූපවාහිනිය |
| | | |
| | | |
| | | |
| | | |

- දෙමාපිය වැඩිහිටියන්ගේ උදවු ඇතිව වර්තමානයේ තොරතුරු ලබාගත හැකි දුරකථන වර්ග කිහිපයක් නිර්මාණය කරන්න.
- ඔබ සැකසූ උපකරණයට අදාළ ගීත සොයා ගායනා කරන්න.
- පුවත්පතක පළ කිරීම සඳහා ඔබ කවි තුනක් නිර්මාණය කරන්න.



අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම: ජී.කේ් සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය
Copyright© www.e-thaksalawa.moe.gov.lk